# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල


තැ.පෙ.අංකය
த. பெ.இ
2171635
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல — 011-
Fax

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — /2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 23/10/2024
පැය 1440

## මාධ්‍ය නිවේදනය

**වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයකට ආධාර අනුබල දුන් සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකය**

2024.10.15 වන දින මාතර පොලිස වසමේ රුවන්වැල්ල ප්‍රදේශයේදී පුද්ගලයෙකුට වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් සිදු කිරීමට අදාළව මාතර පොලිසිය විසින් විමර්ශනයක් ආරම්භ කර තිබිණි.

ඒ අනුව, 2024.10.22 වන දින සවස් කාලයේදී සිද්ධියට සම්බන්ධව ආධාර අනුබල ලබාදුන් සැකකරුවෙකු පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක මර්ධන අංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කැස්බෑව ප්‍රදේශයේ දී අත්අඩංගුවට ගෙන වැඩිදුර විමර්ශන සඳහා මාතර පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වන ගෝනමඩිත්ත පාර, කැස්බෑව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මෙම සැකකරුගෙන් අනාවරණය කරගන්නා ලද තොරතුරු අනුව මනුෂ්‍ය ඝාතනය සඳහා යොදා ගන්නා ලද බවට සැකකරන පිස්තෝල වර්ගයේ අවියක් හා එම පතරොම් 13 ක් ද කාර් රථයක් හා වෑන් රථයක් ද පොලිස් භාරයට ගෙන ඇත. මාතර පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**